# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1871/22 - 2014 ජූලි මස 15 වැනි අඟහරුවාදා - 2014.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :- 110/2/5/2012/14.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරලේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ ඉඹුල්ගස්දෙනිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද මු.පි.කෑ. 3464 හි කැබලි අංක 1, 2, 3 හා 4 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0405 පමණ වන ඉඩම් කොටස්.

**කැබලි අංක 1 - ඉඩමේ නම: යටත්තාවලවත්ත; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0358**

මායිම් :

*උතුර*: මහඔය; *නැගෙනහිර*: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *දකුණ*: ඇල හා යටත්තාවල වත්ත; *බටහිර*: යටත්තාවල වත්ත.

**කැබලි අංක 2 - ඉඩමේ නම: යටත්තාවලවත්ත; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0003**

මායිම් :

*උතුර*: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *නැගෙනහිර*: යටත්තාවලවත්ත; *දකුණ*: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *බටහිර*: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

**කැබලි අංක 3 - ඉඩමේ නම: වල අස්වැද්දුම; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0024**

මායිම් :

*උතුර*: ඇල හා මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *නැගෙනහිර*: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *දකුණ*: කැබලි අංක 4 හා වලඅස්වැද්දුම; *බටහිර*: මු.පි.කෑ. 2084හි කැබලි අංක 1.

**කැබලි අංක 4 - ඉඩමේ නම: වල අස්වැද්දුම; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0020**

මායිම් :

*උතුර*: මු.පි.කෑ. 2084 කැබලි අංක 1, මෙම පිඹුරේ කැබලි අංක 3 හා මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *නැගෙනහිර*: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); *දකුණ*: වල අස්වැද්දුම; *බටහිර*: වල අස්වැද්දුම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014.08.11 වැනි දින පෙ. ව. 10.00 ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014.08.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ආර්. පී. මොහාන් විජේරත්න,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2014 ජූලි මස 14 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 81

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 019914 - 30 - (2014/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.